# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date: 2021-02-18

පැමිණිලිකරු : කේ.ජී. නිමල් මයා.
අංක 60/පී. කළල්ගොඩ.
පන්නිපිටිය.

වගඋත්තරකරුවන් : 01. පො.කො. කුමාරසිංහ මයා.
පොලිස් ස්ථානය. කිරුළපන.

02. පො.ප. යුදේවදාසන් මයා.
පොලිස් ස්ථානය. කිරුළපන.

03. පො.ප.බණ්ඩාර මයා.
පොලිස් ස්ථානය. කිරුළපන.

04. පො.සැ.13503 සුමතිපාල මයා.
පොලිස් ස්ථානය. කිරුළපන.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/3757/13</u>**

පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, තමා 2013.04.13 වන දින සවස 1.00ට පමණ නුගේගොඩ දුම්රිය මාර්ගය අසලින් ගමන් ගන්නා අවස්ථාවේ කිරුළපන පොලිස් ස්ථානයේ නිලධාරීන් යයි පවසා තමාව සෝදිසි කිරීමට අවශ්‍ය බව දැන්වූ බවත්, එම අවස්ථාවේ තමා විසින් කිරුළපන පොලිස් ස්ථානයේ නිලධාරීන් ද යන්න විමසා සිටි බවත් තමා විසින් "තමුන්ලට වෙනත් පොලිස් බලප්‍රදේශයක අනවශ්‍ය විදිහට පරීක්ෂා කරන්න පුළුවන්ද" යනුවෙන් විමසූ බවත් පසුව තමාව දුම්රිය මාර්ගය දිගේ ඇදගෙන ගොස් තම මුහුණට, කුමාර යන නිලධාරියා පහරදුන් බවත් පසුව ස්ථානාධිපති විසින් වැටකින් පොල්ලක් කඩාගෙන විත් පහරදුන් බවත් එයින් පසු තමාගේ වම් අත වේදනා දුන් බවත් දත් දෙකක් (02) සෙලවෙන බවත් හා දත කැඩී ඇති බවත් සදහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තවද පැමිණිලිකරු සදහන් කර ඇත්තේ, වගඋත්තරකරුවන් විසින් තමාට විරුද්ධව අසත්‍ය නඩු පවරා ඇති බවත් එම නිසා තමා හට අනවශ්‍ය මුදල් වියදම් සිදුවී ඇති බවත් තමාට නිලධාරීන් කළ පහරදීම හේතුවෙන් තම වම් අතින් වැඩ කිරීමේ හැකියාවක් නොමැති බවත් එබැවින් තමා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල යොමු කළ බවත්ය.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සදහන් කර ඇත්තේ, ඉහත නම සදහන් පැමිණිලිකරු 2013.09.13 වන දින ගංජා සන්තකයේ තබා ගැනීමේ වරදක් සම්බන්ධයෙන් පො.ප. බණ්ඩාර මහතා සහ පො.සැ.13503 සුමතිපාල යන නිලධාරීන් රේල්වේ ඇවතිච් දුම්රිය මාර්ගය අසල දී අත්අඩංගුවට ගෙන බී 182/13 යටතේ මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවයි. අනතුරුව ගරු අධිකරණ නියෝග මත පොලිස් ඇප මත මුදා හැර ඇති බවත් සැකකරුට පහරදීමක් සිදුවූයේ නම් පැමිණිලිකරු ඒ සම්බන්ධයෙන් ගරු අධිකරණය වෙත දැන්වීමට කටයුතු කිරීමට අවස්ථාවක් තිබූ බවත් ඒ අවස්ථාවේ කිසිදු විරෝධයක් ඉදිරිපත් කර නොමැති බවත් පසුව පහරදීමක් සිදුවූ බවට දන්වා හෝමාගම රෝහලට ඇතුලත් වී ඇති බවත් සදහන් කර ඇත. තවද මෙම පැමිණිලිකරුට කිසිදු පහරදීමක් සිදු කර නොමැති බවත් මොහු අත්අඩංගුවට ගනු ලැබූ ස්ථානය එනම් රේල්වේ ඇවතිච් මාර්ගය කිරුළපන පොලිස් වසමට අයත් මාර්ගයක් බවත් වැඩිදුරටත් සදහන් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :-

පැමිණිලි පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති 2013.09.23 වන දිනැති පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත්තේ තමා 2013.09.13 වන දින සවස 1.00ට පමණ නුගේගොඩ රේල්වේ පාරේ ගමන් කරන විට පාසල් වෑන් රථයක පැමිණි පිරිසක් තමාව සෝදිසි කිරීමට අවශ්‍ය යයි පැවසූ බවත් එහිදී මතවාදයක් ඇති වූ බවත් පසුව එම නිලධාරීන් විසින් රේල්පාර දිගේ ඇදගෙන ගොස් වැටකින් පොල්ලක් කඩාගෙන පහරදීම කළ බවත්ය.

මේ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත 2013.10.28 දිනැති වාර්තාවක් ඉදිරිපත් කරමින් ගංජා සන්තකයේ තබාගෙන සිටියදී රේල්වේ ඇවිතිච් රේල්පාර අසලදී අත්අඩංගුවට ගත් බව ප්‍රකාශ කර ඇත. 2013.09.14 දින සැකකරු බී8182/13 යටතේ මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, මෙම සැකකරු, එනම් පැමිණිලිකරු 2013.09.14 දින අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී පහරදීමක් පිළිබදව ප්‍රකාශයක් ඉදිරිපත් කර නොමැති බවට කරුණු අනාවරණය වන අතර පැමිණිලිකරු ප්‍රතිකාර ලබාගැනීමට රෝහල් ගත ගතවී ඇත්තේ 2013.09.15 වන දින බව නිරීක්ෂණය වේ.

2013.09.20 දින අධිකරණය වෛද්‍යවරයෙකු විසින් පරීක්ෂා කර බලා ඇති අතර අධිකරණය වෛද්‍ය වාර්තාවට අනුව මෙම සැකකරුගේ තුවාල 02ක් පවතින බව නිරීක්ෂණය වේ. දකුණු අතේ කුඩා ඇඟිල්ලේ පිටුපස ප්‍රදේශයේ තැලීමක් දැකීමට ලැබෙන බවත්, 2cm×1cm ප්‍රමාණයේ සීරීමක් වම් වළලුකර ප්‍රදේශයේ තිබෙන බවත් සටහන්ව ඇත. මෙම තුවාල දෙක රෝගියාගේ රෝග ඉතිහාසය සංසන්දනය කිරීමේදී සැසඳීමක් පෙන්නුම් කරන බවත් වෛද්‍ය මතය ලෙස මෙම තුවාලකරු පරීක්ෂා කරනු ලැබූ හෝමාගම මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී එස්.ඩී.ඩබ්. සිරිවර්ධන මහතා විසින් සඳහන් කර ඇත. තවද පැමිණිලිකරු දක්වා සිටිනුයේ වැටක පොල්ලක් කඩා පහරදීම තුළින් ඔහුගේ දත් සෙලවීමට හා දත් කැඩීයාමකට ලක්වූ බවයි.

<u>සරත් කුමාර එදිරිව කල්දේරා</u> **SCFR 124/95** යන නඩුවෙහි තීන්දුවේ දක්වනුයේ. වෛද්‍ය වාර්තාවක් පැමිණිලිකරුවන්ගේ පැමිණිල්ල සමග සර්ව සම්පූර්ණයෙන්ම නොසැසඳෙන අවස්ථාවන්හිදී සලකා බැලිය යුතු කරුණ වනුයේ. එම වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි සියල්ල එක්ව ගත්කළ පෙත්සම්කරුවන්ගේ කතාව සාධාරණත්වයක් දක්වන්නේද යන වගයි.

තවද <u>කළුපහන එරෙහිව මහින්ද (1997) 3 SLR 331 නඩුවේදී</u> 'අනුකම්පාව පෙත්සම්කරු වෙත වන අවස්ථාවේදී පොලිස් සාක්ෂි වල පවතින පරස්පරතා කෙරෙහිද විනිශ්චයකරු හට අවධානය යොමුකළ හැකි බවට' දක්වා ඇත.

මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ මෙම පැමිණිලිකරුට එරෙහිව ගංජා මි.ග්‍රෑ. 1000ක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් අංක 8182/13 යටතේ නඩු පවරා ඇති අතර එම නඩුව සඳහා සාක්ෂිකරුවන් 07දෙනෙකු නම් කර ඇති බවත් එම පැමිණිල්ලේ සාක්ෂිකරුවන් 07 දෙනාගෙන් පළමු සාක්ෂිකරු ලෙස රත්නායක මුදියන්සේලාගේ සංජීව සූරාජ් කුමාර බණ්ඩාර නම් කර ඇති අතර ඔහු මෙම පැමිණිලිකරු විසින් ගොනු කර ඇති පැමිණිල්ලේ 03 වන වගඋත්තරකරු වන බවත් නිරීක්ෂණය වේ.
තවද මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමේදී උපසේවා නිලධාරියා ලෙස කටයුතු කරනු ලැබූ පො.කො.49645 විජේසේන නැමැති නිලධාරියා සැකකරු භාරගෙන ඇති අතර එහිදී පිටතින් පෙනීමට තුවාල නොමැති බව සටහන් දමා ඇත.

පැමිණිලි පාර්ශවය විසින් පහරදීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයට එරෙහිව ඉදිරිපත් කරන චෝදනා වගඋත්තර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කළ ද විමර්ශන ගොනුවට ගොනුවී ඇති කරුණු සලකා බැලීමේදී එලෙස කරනු ලබන ප්‍රතික්ෂේප කිරීම පිළිගත නොහැකි බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුව ඇති බවට කරුණු අනාවරණය වන බව කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01 1, 2, 3, සහ 4 වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු වෙත රු 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුවේ.

02 අදාළ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත සහ පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2021. 03. 18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම..හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri La

පිටපත =: 01. පොලිස්පති.
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

02. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව.
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව.
කොළඹ.

සැයු =: අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/